V. ඉහත I හා II අවස්ථාවලදි දීමනා ලබාගැනිම සදහා අවධානම් ණය අනුපාතය 10 % වඩා අඩු විය යුතු අතර සමස්ථ අංශය ශුද්ධ ලාභය රු.700,000.00 ක් හෝ ඊට වැඩි විය යුතුය. මාසකට ග්‍රාමීය බැංකු අංශයෙන් මෙම දීමනාව සදහා වැයකල හැකි උපරිම මුදල රු.100,000.00 කට සිමා විය යුතුය.

VI. ඉහත I හා II අවස්ථාවලදි ග්‍රාමිය බැංකු වෙනුවෙන් ශුද්ධ ලාභය අනුව ගණනය වන දීමනාව රු.100,000.00 ඉක්මවන්නේ නම් උපරිම දීමනාව රු.100,000.00 වන අයුරින් ශාඛා ලාභයට අනුපාතිකව ගණනය කල යුතුය.

VII. ග්‍රාමීය බැංකු අංශයේ මෙහෙයුම් ක්‍රියාවලියෙන් ජනිතවන ලාභය මත මෙම දීමනාව ගණනය කල යුතු අතර ගෙවල් කුලී ආදායම් වැනි ශීර්ෂයන් යටතේ ආදායම් මෙම දීමනාව ගණනය කිරිමේදි ආදායම වශයෙන් නොගැලපිය යුතුය.

VIII. ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් සදහා ගෙවිය යුතු පොලි, චක්‍ර ලේඛ උපදෙස් හා කාර්ය රීති අනුව ද ගිවිසගත් පොලී අනුපාත අනුව ද ගණනය කොට තිබිය යුතුය .

IX. අදාල මාසයේ බැංකු අංශය සම්බන්ධව සකස් කරන ලද මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා අනුව මූල්‍ය වත්කම් ඌනතාවක් නිරූපනය වන්නේ නම් මෙම දීමනාව ලබා ගැනීමට හිමිකම් නැත.

## 03.2. සමිතියේ පාරිභෝගික අංශය

I. සමිතියේ පාරිභෝගික අංශයේ ප්‍රාදේශික, මිනි කෝප් සිටි, කෝප් සිටි, මෙගා කෝප් සිටි වෙන් වෙන්ව ශුද්ධ ලාභදායි විය යුතුය. සමිතියේ පාරිභෝගික අංශයෙන් මාසිකව ලබාගනු ලබන පොදු පරිපාලන වියදම් සදහා වන කොටස් මුදල අඩුකල විට එම එක් එක් ශාඛාවේ ලාභයෙන් 3% ප්‍රතිශතය වෙන් කර ලබා ගත හැකිය. සමිතියේ ග්‍රාමීය වෙළඳසැල් ජාලය වැඩිවන විට දීමනා ලබාගත හැකි වෙළඳසැල් ප්‍රමාණය වැඩිවන නමුත් සමස්ථ පාරිභෝගික අංශයේ වෙළඳ ජාලයේ ශුද්ධ අලාභ ලබන ප්‍රාදේශික ඇති අවස්ථාකදී, සමස්ත පාරිභෝගික අංශය අලාභයක් වන විට මෙම දීමනා පාරිභෝගික අංශ වෙනුවෙන් ලබාගැනීමට හැකියාවක් නොමැත .

II. පාරිභෝගික අංශයේ මෙහෙයුම් ක්‍රියාවලියෙන් ජනිතවන ලාභය මත මෙම දීමනාව ගණනය කල යුතු අතර ගොඩනැගිලි කුලි, ස්වයං පාලනයට ලබා දී ඇති වෙළඳසැල්වලින් ලැබෙන ආදායම්,ස්ථාවර තැන්පත් පොලී අදායම් ආදිය මෙම දීමනාව ගණනය කිරිමේදි ආදායම වශයෙන් නොගැලපිය යුතුය.

III. ඒ අනුව එක් වෙලඳසැලක මාසික ශුද්ධ ලාභයෙන් 3.0 % ප්‍රතිශතයක් ක් පහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාගැනීමට හැකියාව ඇත .

V. සමිතියේ පාරිභෝගික අංශයට අදාලව මෙම දීමනාව සදහා වැයකල හැකි උපරිම මුදල රු.100,000.00 ක සීමා විය යුතුය.

| සභාපති | උපසභාපති | අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සදහා |
|---|---|---|
| 40 % | 20% | 40% |

- අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සදහා වෙන් කරන දීමනාව ඔවුන් අතර සමානුපාතිකව බෙදිය යුතුය.

